**ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත**

பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்

**CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/ii/05 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.12 28 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්,(පාලන/පිරිස්/ඉංජිනේරු සේවා/සැලසුම්),
ලේකම්, ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා අමාත්‍යාංශය,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**<u>2021 වසර - රාජකාරි කටයුතු ඇරඹීම</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද අංක EST- 1/MISCL/06/0032(I)හා 2020.12.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2020 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.(එහි පිටපතක් ද මේ සමග අමුණා ඇත.)

02 එමගින් “ රට හදන සෞභාග්‍යයේ දැක්ම ” රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දැනට ක්‍රියාත්මක කර ඇති දස ප්‍රතිඥාවන්ගෙන් යුත් වැඩපිළිවෙල 2021 වර්ෂය තුළද ක්‍රියාත්මක කිරීමත්, ඒ සඳහා සාර්ව ආර්ථික ඉලක්ක ළඟා කර ගැනීමේ ඒකායන අභිප්‍රායෙන් යුක්තව සියලුම රජයේ සේවකයන් විසින් ද වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ යහපත උදෙසා කැපවීමෙන් වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. ඒ සඳහා 2021 වසරේ රාජකාරි අරඹන පළමු දිනය වන ජනවාරි මස 01 වන සිකුරාදා දින උදෑසන 9.00ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ පැවැත්වෙන වැඩ සටහනට සමගාමීව සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගිත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇත.

03 මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙසත්, කොවිඩ්- 19 වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ලබා දී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව මෙම වැඩ සටහන පැවැත්විය යුතු බවත් කාරුණිකව දන්වමි.

04 මේ සම්බන්ධව ඔබගේ යටත් ආයතන දැනුවත් කරන ලෙසත් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**ආර්.සී.ද සොයිසා,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත :- ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 4119010<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


**“විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්”**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2020

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.12.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2021 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා දස ප්‍රතිඥාවන්ගෙන් යුත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව එළඹෙන 2021 වර්ෂය තුළ ද මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාර්ව ආර්ථික ඉලක්ක ළඟා කර ගැනීමේ ඒකායන අභිප්‍රායෙන් යුක්තව සියලුම රජයේ සේවකයන් විසින් ද වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ යහපත උදෙසා කැපවීමෙන් වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලැබේ. ඒ සඳහා 2021 වසරේ රාජකාරි අරඹන පළමු දිනය වන ජනවාරි මස 01 වන සිකුරාදා දින සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මෙයින් උපදෙස් දෙමි.

02. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව. 9.00ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවට ම පහත දැක්වෙන වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ලබා දී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් සෑම සාමාජිකයෙකුගේ ම සහභාගිත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)
II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.
III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලුදෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.
IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නඟා කියවීම.
V. වර්තමානයේ රට මුහුණ දී ඇති ප්‍රධාන සෞඛ්‍ය ගැටලුව වන කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම වළක්වා ගැනීම උදෙසා එක් එක් පුද්ගලයා සතුවත්, සමාජය සතුවත් ඇති වගකීම අවධාරණය කෙරෙන දේශනයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධරයෙකුගේ සම්පත් දායකත්වයෙන් පැවැත්වීම.
VI. සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක සාධාරණ සමාජයක් බිහි කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කරගත් කෙටි දේශනයක් ආයතනයේ ප්‍රධානියා විසින් පැවැත්වීම.

03. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

# රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම

දෙදහස් විසි එක වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන්

යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන

සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ

රට හදන සෞභාග්‍යයේ දැක්ම පෙරදැරි කරගත්

විනයගරුක, නීතිගරුක, ගුණගරුක සහ සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහි කිරීමට ද

තිරසර පරිසර කළමනාකරණය මුල්කොටගත්

භෞතික සම්පත් සංවර්ධනය තුළින්

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීමට ද

නූතන තාක්ෂණයෙන් සන්නද්ධ සශ්‍රීක මානව සම්පත මෙහෙයවන

පිරිසිදු රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වන මම,

මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිවරුම් දෙමි.